ET/SSS/2022(2023)/OL/87/S/Q/S-3

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Communication and Media Studies

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය




**Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

Nenasa
The National e-learning Portal for The General Education

**දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 87 | S | I |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
கல்விப் பொதுத் தராதரப் பத்திர )சாதாரண தர(ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I,II**
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I,II
**Communication and Media Studies I,II**

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**
மேலதிக வாசிப்பு நேரம் 10 -நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I**

**සැලකිය යුතුයි:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

**1.** හැරල්ඩ් ඩී. ලැස්වෙල් සන්නිවේදන ආකෘතියේ දැක්වෙන ප්‍රධාන අංග පහ අතුරින් සන්නිවේදකයා හැරුණු විට සෙසු අංග අනුපිළිවෙලින්,

(1) මාධ්‍ය, සන්දේශය, බලපෑම හා ග්‍රාහකයා වේ. (2) බලපෑම, ග්‍රාහකයා, මාධ්‍ය හා සන්දේශය වේ.
(3) සන්දේශය, මාධ්‍ය, ග්‍රාහකයා හා බලපෑම වේ. (4) සන්දේශය, ග්‍රාහකයා, මාධ්‍ය හා බලපෑම වේ.

**2.** සන්නිවේදන ක්‍රියාවලියේ දී බලපෑම,

(1) ධනාත්මක හෝ අයහපත් වේ. (2) ඍණාත්මක හෝ යහපත් වේ.
(3) යහපත් හෝ යෝග්‍ය වේ. (4) ධනාත්මක හෝ ඍණාත්මක වේ.

**3.** විධිමත්ව සිදු වන සන්නිවේදන ක්‍රියාවලියක දී,

(1) සන්නිවේදන ක්‍රියාවලියට බලධාරියෙකු ඇත.
(2) ආරංචිය වේගවත්ව පැතිර යයි.
(3) ආරංචිය විකෘති වීමට ලක් වේ.
(4) සන්නිවේදන ක්‍රියාවලිය ආරම්භය වන්නේ කොතැනකින් ද යන්න කිව නොහැකි ය.

**4.** ගුවන්විදුලි යන්ත්‍රයකට නිසි ලෙස සංඥා, නොලැබීයාම නිසා ඇති වන බාධකය,

(1) අර්ථ බාධක වේ. (2) මාධ්‍ය බාධක වේ.
(3) තොරතුරු බාධක වේ. (4) ස්වභාවික බාධක වේ.

5. සන්නිවේදනය හා සම්බන්ධ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A. ස්වසංකල්පය

B. විෂම ග්‍රාහකයෝ

C. සෘජු ප්‍රතිපෝෂණය

D. ප්‍රදීපාගාර උපක්‍රමය

ඉහත ලක්ෂණවලට අදාළ සන්නිවේදන වර්ග පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) අන්තර්වර්තී, ජන, අන්තර් පුද්ගල, සමූහ (2) අන්තර්පුද්ගල, සමූහ, ජන, අන්තර්වර්තී

(3) සමූහ, අන්තර්පුද්ගල, ජන, අන්තර්වර්තී (4) අන්තර්වර්තී, සමූහ, අන්තර්පුද්ගල, ජන

**6.** ග්‍රාහකයාගේ සංජානනයට බාධා පැමිණෙන හේතුවක්/හේතු වන්නේ,

(1) සන්දේශය තුළ විවිධාර්ථ නොතිබීම (2) වැරදි ලෙස තොරතුරු ගොනු කර සන්දේශ සැකසීම

(3) සන්දේශයේ තොරතුරු සාවද්‍ය නොවීම (4) නිවැරදි මූලාශ්‍රවලින් තොරතුරු ලබා ගැනීම

**7.** සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම පිළිබඳ පිළිගත **නොහැකි** ප්‍රකාශය තෝරන්න.

(1) ජන කණ්ඩායම්වලට සුවිශේෂ විය හැකි ය. (2) සුවිශේෂ මෙන්ම පොදු අර්ථ තිබිය හැකි ය.

(3) ගෝලීය සහ පොදු භාවිතයන් වේ. (4) සංස්කෘතික අනන්‍යතාවන් හෙළි වේ.

**8.** ගමේ සිදු වූ යම් සිදුවීමක් නිමල් කඩවීදියේ දී සමන්ට පැවසී ය. සමන් එය වෙල්යායේ දී නිමල්ට ද නිමල් නාන තොටේ දී එය රසිකාට ද පැවසී ය. අවිධිමත් සන්නිවේදනය අනුව මෙම සිදුවීමට අදාළ ආකෘතිය වන්නේ,

(1) තනි දාමය යි. (2) ඕපාදූප දාමය යි.

(3) සම්භාවිතා දාමය යි. (4) පර්ෂද දාමය යි.

9. ආරෝග්‍යශාලාවක වෛද්‍යවරුන් හා අනෙකුත් කාර්ය මණ්ඩලය ඒ ඒ ස්ථානයන්හි කාර්යන්හි යෙදී සිටින විටක හදිසි ප්‍රතිකාර සඳහා ඔවුන් කැඳවන්නට සිදු වූ අවස්ථාවක බහුලව යොදා ගත් උපකරණයකි.

(1) කුඩා සීනුව (2) ස්ථාවර දුරකථනය

(3) පේජරය (4) CCTV උපකරණය

**10.** ද්විමාර්ගික සන්නිවේදන අකෘතියක් තුළ

A. ප්‍රතිපෝෂණයක් නොමැත.

B. සන්නිවේදක හා ග්‍රාහක භූමිකා ස්ථාවර ය.

C. සන්නිවේදක හා ග්‍රාහක භූමිකා හුවමාරු වේ.

D. ප්‍රතිපෝෂණය සක්‍රිය යි.

ඉහත ප්‍රකාශන අතුරින් නිවැරදි වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා D ය. (4) C හා D ය.

**11.** අත්පිටපත හා මුද්‍රිත පිටපත සසඳමින් නිවැරදි කිරීම හඳුන්වනු ලබන්නේ,

(1) සෝදුපත් බැලීම ලෙසිනි. (2) පිටු සැකසීම ලෙසිනි.

(3) පිටපත් කිරීම ලෙසිනි. (4) අකුරු සංයෝජනය ලෙසිනි.

**12.** තොරතුරු රැස් කරන්නෙක් සතු විය යුතු මූලික ගුණාංගයක් **නොවන්නේ**,

(1) උපායශීලී බව (2) පක්ෂපාතී බව

(3) කාල කළමනාකරණය (4) සුහද බව

**13.** දෘශ්‍ය සන්නිවේදනය සඳහා සාම්ප්‍රදායික ව භාවිත කළ ක්‍රමවේද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ගින්දර, දුම, කොළ අතු එල්ලීම, රූප සටහන්

(2) ගින්දර, දුම, හූ හඬ, කොළ අතු එල්ලීම

(3) දුම, හූ හඬ, කොළ අතු එල්ලීම, රූප සටහන්

(4) කොළ අතු එල්ලීම, රූප සටහන්, අංග චලන, හූ හඬ

**14.** පොදු පුවත්, ආරංචි හෝ සිදුවීම් ඇතුළත් කොට මුද්‍රණය කොට පළ කරනු ලබන මුද්‍රිත මාධ්‍ය වන්නේ,

(1) පොත් (2) පුවත්පත්

(3) සඟරා (4) පෝස්ටර්

**15.** ශ්‍රී ලංකාවේ ප්‍රථම රූපවාහිනී නාලිකාව ආරම්භ කිරීමට දායක වූයේ,

(1) අනිල් විජේවර්ධන, ශාන් වික්‍රමසිංහ හා ඊ. හාපර් ය.

(2) ශාන් වික්‍රමසිංහ, ඩී.ආර්. විජේවර්ධන හා එච්.එස්. පෙරේරා ය.

(3) අනිල් විජේවර්ධන, ශාන් වික්‍රමසිංහ හා බොබ් ක්‍රිස්ට් ය.

(4) බොබ් ක්‍රිස්ට්, උපාලි විජේවර්ධන හා රංජිත් විජේවර්ධන ය.

**16.** පුවත්පතක ප්‍රධාන කර්තෘගේ මූලික වගකීම් වන්නේ,

A. කතුවැකිය ලිවීම

B. පුවත්පතේ අන්තර්ගතය හා ව්‍යූහය සැකසීම

C. පුවත්පතේ නෛතික වගකීම දැරීම

D. පුවත්පතේ පිටු සැකසීම

(1) A,B හා C ය. (2) A,C හා D ය.

(3) A,B හා D ය. (4) B,C හා D ය.

**17.** ෂැනොන් - වීවර් සන්නිවේදන ආකෘතිය හා ද්වි මාර්ගික ආකෘතිය අතර සමානකමකි.

(1) ප්‍රතිපෝෂණ හා ප්‍රතිචාර පිළිබඳ සඳහන් වීම

(2) සන්දේශයක් ග්‍රාහකගත වන බව පෙන්වීම

(3) සන්නිවේදනයේ රේඛීය ස්වභාවය පැහැදිලි කිරීම

(4) සන්නිවේදනයේ තාක්ෂණික ක්‍රියාවලිය පෙන්වා දීම

**18.** 'ප්‍රදීපාගාර උපක්‍රමය' ලෙස අර්ථ ගැන්වෙන්නේ,

(1) අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී ග්‍රාහකයා දෙස බලා කතා කිරීම යි.

(2) ජන සන්නිවේදනයේ දී නියමිත කැමරාව දෙස බලා කතා කිරීම යි.

(3) සමූහ සන්නිවේදනයේ දී ග්‍රාහක පිරිස දෙස නිතර බලමින් කතා කිරීම යි.

(4) මහජන සන්නිවේදනයේ දී සියල්ලන්ටම ඇසෙන ලෙස කතා කිරීම යි.

**19.** කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයට අලුතින් සේවයට පැමිණි සිනෙලි, ආයතන තොරතුරු සන්නිවේදනය සඳහා වෙබ් අඩවියක් ආරම්භ කරමු යැයි නිතර යෝජනා කරන්නී ය. එමගින් ඇගේ සාධනීය අපේක්ෂාවක් වීමට **අවම** ඉඩක් ඇත්තේ,

(1) කාර්යාලයේ තොරතුරු යාවත්කාලීන කිරීම යි.

(2) කාර්යාලයේ සියලු ම කාර්යන් සමාජයට විවෘත කිරීම යි.

(3) කාර්යාලයේ තොරතුරු වේගවත් ව නිකුත් කිරීම යි.

(4) වෙබ් අඩවිය ඔස්සේ විවිධ ප්‍රතිචාර වහා ලබා ගැනීම යි.

**20.** කැමරා භාවිතයේ දී යොදාගනු ලබන යුහුමු කාච සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ඈත පවතින වස්තුවල සමීප රූප ලබා ගත හැකි ය.

(2) පියවි ඇසට පෙනෙන දර්ශනයට සමාන වස්තු ඡායාරූපයට හසු කර ගත හැකි ය.

(3) පුළුල් පරාසකය ඇති වස්තු ඡායාරූපයට හසුකරගත හැකි ය.

(4) පුළුල් පරාසයක ඇති වස්තු මෙන්ම ඈත පවතින වස්තුවක සමීප රූප ද ලබා ගත හැකිය.

**21.** පහත දැක්වෙන්නේ සන්නිවේදන ස්වරූපවල ලක්ෂණ කිහිපයකි.

A. භාෂාවේ දෘෂ්‍ය ස්වරූපය යි.

B. දැකීම නිසා සිදු වේ.

C. වාචික සන්නිවේදනයේ සාර්ථකත්වයට යොදාගත හැකි ය.

D. ධනාත්මක යෙදවුම් හා අදහස් යොදා ගැනේ.

මෙම ලක්ෂණවලට ගැළපෙන සන්නිවේදන ස්වරූප පිළිවෙළින් ඇති වරණය වන්නේ,

(1) අවාචික, දෘශ්‍ය, වාචික, ලිඛිත (2) ලිඛිත, අවාචික, දෘශ්‍ය, වාචික

(3) අවාචික, දෘශ්‍ය, ලිඛිත, වාචික (4) ලිඛිත, දෘශ්‍ය, අවාචික, වාචික

**22.** පෝල් ඩී. මැසෙනියර් ට අනුව තොරතුරු විශ්වසනීයත්වය සඳහා තිබිය යුතු සාධක අතරට අයත් **නොවන** සාධකය තෝරන්න.

(1) සමතුලිත බව (2) නිවැරදි බව

(3) පැහැදිලි බව (4) නිරවුල් බව

**23.** ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම ස්ථාපිත කර ඇත්තේ,

(1) සෑම කෙනෙකුටම නිදහසේ ජීවත් වීමට ඇති අයිතිය තහවුරු කිරීමට ය.

(2) රජයේ නිලධාරීන් අතින් සිදුවන මානව හිමිකම් කඩවීම පිළිබඳ පරීක්ෂා කිරීමට ය.

(3) පුද්ගල පැවැත්ම තහවුරු කරගනිමින් ගෞරවනීය පුරවැසියෙකු ලෙස ජීවත් වීමට ය.

(4) ජනමාධ්‍ය ආයතනයක මානව හිමිකම් පිළිබඳ වාර්තා කරන අයුරු විමසීමට ය.

**24.** ආයතනයකට සම්බන්ධ මාධ්‍යවේදීන් බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් දෙක වන්නේ,

(1) මාණ්ඩලික මාධ්‍යවේදීන් හා නිදහස් මාධ්‍යවේදීන්

(2) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් හා නිදහස් මාධ්‍යවේදීන්

(3) මාණ්ඩලික මාධ්‍යවේදීන් හා ප්‍රාදේශීය මාධ්‍යවේදීන්

(4) වෘත්තීය මාධ්‍යවේදීන් හා නිදහස් මාධ්‍යවේදීන්

**25.** අධ්‍යක්ෂවරයා විසින් හසුරුවනු ලබන නළු නිළියන් නොමැති වීම ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,

(1) වාර්තා චිත්‍රපටවල ය. (2) කෙටි චිත්‍රපටවල ය.

(3) වෘත්තාන්ත චිත්‍රපටවල ය. (4) අර්ධ වාර්තා චිත්‍රපටවල ය.

**26.** ජනමාධ්‍ය සන්දේශවලට නිරාවරණය වන "පුරවැසියා" සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. පුරවැසියා ඡන්ද බලය හිමි තැනැත්තෙකි.

B. ඔහු නීතිගරුක ආචාරශීලී හා ගුණගරුක විය යුතු ය.

C. පුරවැසියා යම් නිත්‍යානුකූල දේශසීමාවක නිත්‍යානුකූලව ජීවත් වේ.

D. ජනමාධ්‍ය මගින් පුරවැසිභාවය පිළිබඳ පරමාදර්ශී සංකල්ප පෝෂණය කළ යුතු ය.

ඉහත ප්‍රකාශ ඇසුරින් වඩාත් නිවැරදි වන්නේ,

(1) A,B සහ C පමණි. (2) A,B සහ C පමණි.

(3) A,B හා D පමණි. (4) A,B,C සහ D සියල්ල ය.

**27.** පුවත්පත් අන්තර්ගතය පිළිබඳ විශේෂතාවක් **නොවන්නේ,**

(1) කාලානුරූපීව අන්තර්ගතය වෙනස් වීම ය.

(2) අන්තර්ගතය සඳහා නිර්මාණශීලී ආකෘති භාවිත කිරීම ය.

(3) අන්තර්ගතයෙහි මුද්‍රණ ශිල්පීය විවිධතා දැකිය හැකි නොවීම ය.

(4) අන්තර්ගතයෙහි පෙළ සහ රූපය ගැලපීම ය.

**28.** පුද්ගලාන්තර සන්නිවේදනය ප්‍රබල කිරීමට වඩාත් ම දායක වන සන්නිවේදන ස්වරූපය වන්නේ,

(1) වාචික සන්නිවේදනය (2) දෘශ්‍ය සන්නිවේදනය

(3) ලිඛිත සන්නිවේදනය (4) නිර්වාචික සන්නිවේදනය

**29.** "පිටු 49කට නොඅඩු වාර සඟරාවක් හෝ මුද්‍රිත කඩදාසි ගොනුවක් පොතක් ලෙස සලකනු ලබයි." මෙම අර්ථකථනය සිදු කළේ,

(1) ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලය යි.

(2) යුනිසෙෆ් ආයතනය යි.

(3) යුනෙස්කෝ සංවිධානය යි.

(4) එක්සත් ජාතීන්ගේ සංවිධානය යි.

**30.** කොටසින් කොටස කතාවේ තේමාව වෙනස්වන ටෙලි නාට්‍ය වර්ගය වන්නේ,

(1) ඒකාංගික නාට්‍ය (2) විවිධාංගික නාට්‍ය

(3) මෙගා ටෙලි නාට්‍ය (4) ප්‍රාසාංගික නාට්‍ය

**31.** ''සංවෘත පරිපථ රූපවාහිනී කැමරා'' භාවිතයේ ඇති සුවිශේෂ වාසියක් වන්නේ,


(1) යම් සිදුවීමක නිශ්චල ඡායාරූප ලබා ගත හැකි වීම

(2) නිවසේ සිට තම ආයතනය නිරීක්ෂණය කිරීමට හැකිවීම

(3) අනවසරයෙන් රැඳී සිටී ද යන්න පරීක්ෂාකර සංඥා නිකුත් කිරීමට හැකි වීම

(4) සේයා පටල භාවිතයෙන් උසස් මට්ටමේ ඡායාරූප ලබා ගත හැකි වීම

❖ **32 සිට 34 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීමට මෙහි දැක්වෙන පුවත්පතකින් උපුටා ගත් කොටස පදනම් කර ගන්න. (වාර්තාකරුගේ නම ඉවත් කොට ඇත)**




**32.** මෙහි දැක්වෙන්නේ,

(1) සිද්ධියකි. (2) ප්‍රවෘත්තියකි.
(3) තොරතුරකි. (4) ආරංචියකි.

**33.** මෙහි සඳහන් ප්‍රධාන කරුණු දෙකක් වන්නේ,

(1) ශීර්ෂය හා මූල පාඨය යි. (2) සිරස්තලය හා ප්‍රවෘත්ති දේහය යි.
(3) මූල පාඨය හා ප්‍රවෘත්ති දේහය යි. (4) මූල පාඨය හා යටිකුරු පිරමීඩය යි.

**34.** මෙම උපුටනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සමාජයට වැඩි බලපෑමක් ඇති දෘඪ පුවතකි.
(2) මෙය මෘදු පුවතක් වන අතර සමාජයට වැඩි බලපෑමක් කරයි.
(3) මෙය දෘඪ පුවතක් වන අතර සමාජයට වැඩි බලපෑමක් නැත.
(4) මෙහි ප්‍රවාහන ඇමතිගේ නම සඳහන් නොවන නිසා සාවද්‍ය පුවතකි.

❖ **ප්‍රශ්න අංක 35 සිට 37 දක්වා පිළිතුරු සැපයීම සඳහා පහත වගුව උපයෝගී කරගන්න.**

| | | | | |
|---|---|---|---|---|
| කළුලෑල්ල A | සුදු ලෑල්ල B | කාන්දම් ලෑල්ල C | පත්‍රිකා ලෑල්ල D | පිටු පෙරළන ලෑල්ල E |
| ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය F | කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය G | ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය H | බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය I | අන්තර්ක්‍රියාකාරී පුවරුව J |

**35.** මෙවර විද්‍යා විෂයය සම්මන්ත්‍රණයට පැමිණි දේශකයාට තමා ගෙනැවිත් ඇති පොතක පිටුවක් ඒ අවස්ථාවේ දී විශාලනය කර පෙන්වන්නට අවශ්‍ය විය. ඒ සඳහා ඔහුට භාවිත කළ හැකි වඩාත් සුදුසු උපකරණය අයත් අක්ෂරය වන්නේ,

(1) F ය. (2) E ය. (3) H ය. (4) J ය.

**36.** විද්‍යා විෂයය සම්මන්ත්‍රණයට ළමයින් 300ක් පමණ සහභාගී වූ අතර, දේශකයා සකස් කරගෙන පැමිණි වීඩියෝ දර්ශන පෙන්වීමට යොදාගත හැකි උපකරණ වන්නේ,

(1) F හා I ය. (2) H හා I ය. (3) I හා G ය. (4) J හා I ය.

**37.** පහත දැක්වෙන කරුණුවලට ගැළපෙන උපකරණය වන්නේ,

- විනිවිදක පත්‍රවල ලිවීම සඳහා නිපදවා ඇති පෑන් පාවිච්චි කිරීමෙන් විනිවිදක පත්‍ර මත ලිවීම හෝ ඇඳීම කළ හැකි ය.
- දිගු කල් භාවිතය සඳහා විනිවිදක පත්‍ර සකස් කරනු ලබන විටක ස්ථිර තීන්ත යොදා ගැනීම යෝග්‍ය ය.
- තිරය හා යන්ත්‍රය අතර දුර වෙනස් කිරීමෙන් එහි රාමුව සකස් කර ගත හැකි ය.

(1) F ය. (2) G ය. (3) H ය. (4) J ය.

**38.** සඟරාවක අන්තර්ගතය සකස් වීමේ දී සැලකිලිමත් විය යුතු වන්නේ,

A. ඉලක්කගත ග්‍රාහක පිරිසක් සිටීම පිළිබඳව ය.

B. අඛණ්ඩව නිශ්චිත කාලසීමාවක මුද්‍රණය කිරීම පිළිබඳව ය.

C. උණුසුම් පුවත් වාර්තා කිරීම පිළිබඳව ය.

D. පර්යේෂණාත්මක හා වටිනා තොරතුරු අන්තර්ගත කිරීම පිළිබඳව ය.

ඉහත ABCD අතුරින් වඩාත් නිවැරදි වන්නේ,

(1) ABD පමණි. (2) ACD පමණි.

(3) BCD පමණි. (4) ABCD සියල්ලම ය.

**39.** ජංගම දුරකථන වෙත ප්‍රවෘත්ති ලබාදීම වර්තමානයේ සුලබව සිදු වේ. මෙම ක්‍රියාවලියේ දී වඩාත් අවධානය යොමු විය යුත්තේ ප්‍රවෘත්තියේ,

(1) සංක්ෂිප්ත බව හා නිරවද්‍යතාව පිළිබඳව ය.

(2) නිරවද්‍යතාව හා විස්තරාත්මක බව පිළිබඳව ය.

(3) නිරවද්‍යතාව හා නිර්මාණාත්මක බව පිළිබඳව ය.

(4) ආකර්ෂණීය බව හා සංක්ෂිප්ත බව පිළිබඳව ය.

40. ප්‍රාදේශීය වාර්තාකරුවෙකුට හදිසි දේශපාලන ගැටුමක් පිළිබඳ පුවතක් හා ඊට අදාළ ඡායාරූප ආදිය තම මාධ්‍ය ආයතනයට ක්ෂණිකව යොමු කිරීමට වඩාත් සුදුසු ක්‍රමවේදය,

(1) ෆැක්ස් (Fax) යන්ත්‍රයෙන් අදාළ තොරතුරු ලබා දීමයි.

(2) විද්‍යුත් තැපැල (E mail) පණිවිඩයක් ලෙස යොමු කිරීමයි.

(3) Youtube වෙත වහා ම උඩුගත කොට ආයතනයට ලබා ගැනීමට යොමු කිරීමයි.

(4) අතින් ගෙන ගොස් භාරදීම යි.

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education, Sri Lanka**

| 87 | S | II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
கல்விப் பொதுத் தராதரப் பத்திர )சாதாரண தர(ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - **2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I,II**
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I,II
**Communication and Media Studies I,II**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II**

* **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක් ද** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු 20ක් හිමිවන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.

1. ශ්‍රී ලංකාවේ තවදුරටත් වර්ධනය වෙමින් පවතින බෝ නොවන රෝගී තත්ත්වයන් පිළිබඳ ජනතාව කඩිනමින් දැනුම්වත් කිරීම සඳහා සැලසුම් සකස් කළ යුතු ව ඇත.

(i) මේ පිළිබඳ ජනතාව පොදුවේ දැනුම්වත් කිරීම සඳහා වඩාත් උචිත සන්නිවේදනය වර්ග කුමක් ද?

(ii) ඉහත සන්නිවේදනය වර්ගයේ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(iii) බෝ නොවන රෝග සම්බන්ධයෙන් ජනතාව වැඩිදුරටත් දැනුම්වත් කිරීම සඳහා යොදා ගත හැකි සන්නිවේදනය විධික්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(iv) බෝ නොවන රෝග සම්බන්ධයෙන් තොරතුරු රැස්කර ගත හැකි මූලාශ්‍ර වර්ග **දෙකක්** නම් කරන්න.

(v) අවිධිමත් ආකාරයෙන් ජනතාවට තොරතුරු සන්නිවේදනය වන ආකෘති **දෙකක්** සඳහන් කරන්න.

(vi) බෝ නොවන රෝග සම්බන්ධයෙන් විශේෂාංග ලිපියක් සකස් කිරීමේ දී තොරතුරු රැස්කර ගැනීමට භාවිත කළ හැකි ශිල්පීය ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(vii) ඉහත ලිපිය විද්‍යුත් පුවත්පතක පළ කරන්නේ නම් එහි ඇති වාසි **දෙකක්** සඳහන් කරන්න.

(viii) ප්‍රාදේශීය වශයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් මගින් මේ පිළිබඳ දැනුවත් කරයි. ඒ සඳහා යොදා ගත හැකි ප්‍රක්ෂේපනීය මාධ්‍ය **දෙකක්** නම් කරන්න.

(ix) අන්තර්ජාලය භාවිතයෙන් බෝ නොවන රෝග පිළිබඳ තොරතුරු සන්නිවේදන කිරීමෙන් ඒ සඳහා යොදා ගත හැකි සමාජ මාධ්‍ය ජාල **දෙකක්** නම් කරන්න.

(x) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවියෙන් බෝවන හා බෝ නොවන රෝග පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඇත. එවැනි වෙබ් අඩවියක් පවත්වාගෙන යෑමේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

2. මහජනතාව ඔල්වරසන් දෙමින් නගර සභා ක්‍රීඩාංගනයේ රූපවාහිනී පුළුල් තිරය ඔස්සේ ශ්‍රී ලංකා බංගලාදේශ පන්දුවාර විස්සයි විස්සේ ක්‍රිකට් තරඟය නරඹමින් සිටියෝ ය.

(i) රූපවාහිනිය ඔස්සේ තරඟය නැරඹීම කුමන සන්නිවේදනය ස්වරූපයකට අයත් වන්නේ ද?

(ii) රූපවාහිනී මාධ්‍යයේ විශේෂ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(iii) ක්‍රීඩා තරග රූපවාහිනී මාධ්‍ය ඔස්සේ නැරඹීමට හැකි එක් සජීව වැඩසටහන් ප්‍රභේදයකි. එවැනි රූපවාහිනී වැඩසටහන් ප්‍රභේද **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) රූපවාහිනී මාධ්‍ය වඩාත් ප්‍රබල මාධ්‍යයක් බවට පත් ව තිබේ. රූපවාහිනී මාධ්‍යයේ නව ප්‍රවණතා **හතරක්** නිදසුන් සහිත ව විස්තර කරන්න.

3. ජගත් මහතා රජයේ ආයතනයක විධායක නිලධාරිවරයෙකි. ඔහු නවක පත්වීමක් ලැබ තම කාර්යාලයට පැමිණි සෙව්වන්දි මහත්මියට කාර්යාලයේ මාධ්‍ය ක්‍රියාවලිය පහදා දුන්නේ ය.

(i) කාර්යාලයේ දී භාවිතයට ගත හැකි මූලික මාධ්‍ය උපකරණ **2ක්** ලියන්න.

(ii) සෙව්වන්දි මහත්මිය පරිගණක ගත කළ තොරතුරු ජගත් මහතාට යැවීමට භාවිත කළ හැකි මාධ්‍ය උපකරණ **2ක්** දක්වන්න.

(iii) පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ ප්‍රධාන පියවර **තුනක්** පැහැදිලි කරන්න.

(iv) පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ අවශ්‍යතා **හතරක්** නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

4. ග්‍රාහක ප්‍රතිපෝෂණය ලැබීමෙන් සන්නිවේදනය ක්‍රියාවලිය සාර්ථක වේ. විටෙක ග්‍රාහකයා නිවේදකයා බවට පත් වේ.

(i) ද්වි මාර්ගික සන්නිවේදනය ක්‍රියාවලිය රූප සටහනක් මගින් දක්වන්න.

(ii) සන්නිවේදනයේ මූලික කාර්ය **දෙකක්** සඳහන් කරන්න.

(iii) සන්නිවේදකයා විසින් සන්දේශයක් සකස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු ග්‍රාහකයාගේ සංජානනයට බාධා පැමිණෙන කරුණු **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) පහත සඳහන් මාතෘකා **හතරක්** නිදසුන් විස්තර කරන්න.

* අර්ථ බාධක
* මාධ්‍ය බාධක
* දොරටුපාල සංකල්පය
* සංජානනය

5. තොරතුරු බහුල සමාජයක එකම තොරතුර පවා මාධ්‍ය විසින් විවිධ ස්වරූපයන්ගෙන් ඉදිරිපත් කරයි.

(i) මුද්‍රිත මාධ්‍යයේ විවිධ ස්වරූප **දෙකක්** සඳහන් කරන්න

(ii) මාධ්‍ය එකම තොරතුර විවිධ ස්වරූපයන්ගෙන් ඉදිරිපත් කිරීමට බලපාන හේතු **දෙකක්** දක්වන්න,

(iii) පුවත්පතක් අන්තර්ගතයේ ඉදිරිපත් කරන විවිධ ආකෘති **දෙකක්** පැහැදිලි කරන්න.

(iv) පුවත්පතක අන්තර්ගතයේ විශේෂතා **4ක්** නිදසුන් සහිත ව විස්තර කරන්න.

6. කසුන්ගේ සුහුරු ජංගම දුරකථනයට ලැබුණු ප්‍රවෘත්තියක සඳහන් වූයේ ලංකාවේ කොළඹ ආසන්න ප්‍රදේශ ගණනාවක් දුමාරයකින් වැසී ගොස් ඇති බවයි. කසුන් සිය ජංගම දුරකථනයෙන් එම ප්‍රවෘත්තියට අදාළ පුවත්පත් වාර්තා රූපවාහිනී ප්‍රවෘත්ති වීඩියෝ දර්ශන හා නව මාධ්‍ය ඔස්සේ පළ වූ තොරතුරු නැරඹුවේ ය.

(i) විවිධ මාධ්‍ය එකට එක්වීම හඳුන්වන නාමය කුමක් ද?

(ii) විවිධ මාධ්‍ය එකට එක්වීම හේතුවෙන් නූතන ජනමාධ්‍යකරුවන් මුහුණ දී ඇති අභියෝග **දෙකක්** සඳහන් කරන්න.

(iii) රූපවාහිනී සාකච්ඡා වැඩසටහනක දී යොදා ගත හැකි අනෙකුත් මාධ්‍ය **තුනක්** පැහැදිලි කරන්න.

(iv) මාධ්‍ය එකට එක්විම ග්‍රාහකයා කෙරෙහි ඇති කරන බලපෑම කරුණු **හතරක්** ඔස්සේ නිදසුනක් සහිත ව පැහැදිලි කරන්න.

7. ප්‍රදේශයේ බස් නැවතුම් පොළ මහජනතාවගේ විවිධ අනිසි ක්‍රියාකාරකම් හේතුවෙන් අපවිත්‍ර වී ඇත. ප්‍රසිද්ධ පෞද්ගලික ජනමාධ්‍ය ආයතනයක් පවිත්‍රතා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළේ ය.

(i) මෙම ක්‍රියාව අයත් වන්නේ කුමන ජනමාධ්‍ය නියෝජන අධ්‍යයනයකට ද?

(ii) ජනමාධ්‍ය විසින් මහජනතාවගේ මනසේ සංවර්ධනාත්මක සිතුවිලි වර්ධනය කළ යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(iii) බස් නැවතුම් පොළ පවිත්‍රව තබා ගැනීම සඳහා ජනතාව දැනුවත් කළ හැකි මාධ්‍ය ක්‍රියාකාරකම් **තුනක්** පැහැදිලි කරන්න.

(iv) රටේ පොදු ස්ථාන රැක ගැනීම සඳහා නව මාධ්‍ය ඔස්සේ ක්‍රියාත්මක කළ හැකි ප්‍රචාරාත්මක ක්‍රියාකාරකම් **හතරක්** උදාහරණ සහිත ව විස්තර කරන්න.

*****